# කොළඹ විශ්වවිද්‍යාලය

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ඩිප්ලෝමා පාඨමාලාව - 2022 - (SLQF Level 03)

කොළඹ විශ්වවිද්‍යාලයීය ජනමාධ්‍ය අංශය මෙහෙයවන සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ඩිප්ලෝමා පාඨමාලාවට අදාළව (NVQ Level 05) 2022 වර්ෂය සඳහා අයදුම්පත් කැඳවා ඇත. ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ රැකියාවල නියුක්ත සහ අදාළ සේවා පළපුරුද්ද ඇති සුදුසුකම් සහිත අපේක්ෂකයන්ගෙන් ඉහත සඳහන් පාඨමාලාව සඳහා අයදුම්පත් භාරගනු ලැබේ. මීට අමතරව, නිදහස් මාධ්‍යවේදීහු, දැනට ලේඛන කලාවෙහි නියුක්ත සාහිත්‍යවේදීහු හා ජනමාධ්‍ය ක්ෂේත්‍රයෙහි නිර්මාණ ශිල්පීහු ද, මාධ්‍ය ඒකකවල නිලධාරීහු ද මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති. එමෙන් ම, ජනමාධ්‍ය ක්‍රියාකාරකම්වල නියුක්ත ව සිටින ආධුනිකයන් සීමිත සංඛ්‍යාවක් ද පාඨමාලාවට ඇතුළත් කරගැනෙන බැවින් ඔවුන්ට ද සිය අයදුම්පත් යොමු කළ හැකි ය.

| | | |
|---|---|---|
| **ඇතුළත්වීමේ සුදුසුකම්** | : | අ.පො.ස. (උ.පෙළ) සාමර්ථ්‍ය තුනක් සහිතව සමත්ව තිබීම හා වසරක වෘත්තීය සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් (NVQ Level 4) **හෝ** අ.පො. ස. (සා. පෙළ) විෂයන් හයක් සහිතව සමත් ව තිබීම හා වසර තුනක වෘත්තීය සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් **හෝ** ජනමාධ්‍ය ක්ෂේත්‍රයෙහි හෝ ජනමාධ්‍ය විෂය ක්ෂේත්‍රයට අදාළ ව (අධ්‍යයන අංශය විසින් පිළිගනු ලබන) සහතික පත්‍ර පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම හා වසර තුනක වෘත්තීය සුදුසුකම් |
| **පාඨමාලා කාලසීමාව** | : | වසර එකකි (සෙනසුරාද දිනවල පෙ.ව 9.00 සිට ප.ව 1.30 දක්වා) |
| **පාඨමාලා ගාස්තුව** | : | රු. 60,000.00 - (ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා) USD 600 - (විදේශීය අයදුම්කරුවන් සඳහා) |
| **මාධ්‍යය** | : | සිංහල මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටියහොත් ඉංග්‍රීසි/දෙමළ මාධ්‍ය පාඨමාලා ද පැවැත්වෙනු ඇත. |
| **තෝරාගනු ලබන්නේ** | : | සම්මුඛ පරීක්ෂණයක් මගිනි. |
| **අයදුම්පත් හා විස්තර** | : | කොළඹ විශ්ව විද්‍යාලයේ ජනමාධ්‍ය අංශයේ වෙබ් අඩවියෙන් හෝ කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා ප්‍රකාශන අංශයෙන් (Academic and Publication Branch) පාඨමාලාවට අදාළ විස්තර පත්‍රිකාව ලබාගත හැකිය. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් යොමු අංක 304081700005 දරන කොළඹ විශ්වවිද්‍යාලයේ රැස්කිරීමේ ගිණුමට බැරවන සේ ගෙවන ලද රු. 1,000/= (අයදුම් පත්‍ර ගාස්තුව) ලදුපතද සමග කොළඹ විශ්වවිද්‍යාලයේ පහත දැක්වෙන ලිපිනයට යොමු කරන්න. නැතහොත් ගෙනවිත් භාර දෙන්න.<br>**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ඩිප්ලෝමා පාඨමාලාව - 2022**<br>**අධ්‍යයන හා ප්‍රකාශන අංශය,**<br>**කොළඹ විශ්වවිද්‍යාලය,**<br>**තැපැල් පෙට්ටිය 1490, කොළඹ 03.** |
| **සැ.යු.** | : | කොළඹ විශ්වවිද්‍යාලයේ බාහිර/අභ්‍යන්තර සිසුවකු ලෙස එකම අවස්ථාවේදී වෙනත් පාඨමාලාවකට ලියාපදිංචි වී ඇත්නම් මේ සඳහා අයදුම් කළ නොහැකි බව කරුණාවෙන් සලකන්න. |

**අයදුම්පත් භාර ගනු ලබන අවසාන දිනය :2021.12.23**

**වෙබ් අඩවිය - https://arts.cmb.ac.lk/journalism/index.php/diploma-in-communication-media-studies**

**ලේඛකාධිකාරී.**